**ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

**----------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

-------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

**----------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) අත්තිකාරම් ගෙවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම වූ රු.686,270 ක මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගිණුම්ගත කර නොතිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය සහ අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය එම වටිනාකමින් සැසඳී නොතිබුණි | සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම වූ රු.686,270 ක මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගිණුම්ගත කර නොතිබුණේ සිදු වූ අතපසුවීමකිනි. මින් ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. | වියදම් නිවැරදිව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කළ යුතු වේ. |

(ආ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.173,300 ක් වූ වත්කම්, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වර්ෂයේ එකතු කිරීම් යටතේ දක්වා නොතිබීම නිසා මූල්‍ය නොවන වත්කම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ වත්කම් **2102** කාර්යාල උපකරණ අත්පත්කර ගැනීම් යටතේ ගිණුම්ගත නොකළ නිසා මූල්‍ය නොවන වත්කම් වලට ඇතුළත් වී නොමැත**.** මෙවැනි දෝෂ ඉදිරියේදී වලක්වා ගන්නා බව දන්වමි. | වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් එකතු කිරීම් නිවැරදිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කළ යුතු වේ. |

**6.2 ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (table below) | ඉදිරියේදී ඇප ලේඛනය, හානි පිළිබඳ ලේඛනය, ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ පැමිණීමේ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කරමි. | අදාල ලේඛන හා පොත්පත් යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වේ. |

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 | පවත්වා නොතිබුණි |
| (ආ) හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි |
| (ඇ) ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ පැමිණීමේ ලේඛනය | ප්‍රසම්පාදන මාර්ගෝප දේශ සංග්‍රහය | පවත්වා නොතිබුණි |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන වැය විෂයයන් 02 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 10ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව වූ රු.38,850,000 කින් එකතුව රු.26,023,884 ක් ප්‍රතිපාදන ඉතිරිව තිබූ අතර එය එක් එක් වැය විෂයයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාාල කටයුතු නිසිපරිදි ක්‍රියාත්මක නොවීමත් පුරප්පාඩු තනතුරු වලට බඳවා ගැනීමට නොහැකි වීමත් නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධි විධාන ප්‍රකාරව සකසුරුවම හා කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

## 2.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ රු.141,543 ක් වූ බැරකම් පිළිබඳ විස්තර භාණ්ඩාගාරයට විධිමත්ව වාර්තා කර නොතිබුණි. | ඉදිරි වර්ෂ වලදී බැරකම් පිළිබඳ විස්තර භාණ්ඩාගාරයට විධිමත්ව වාර්තා කිරීමට කටයුතු කරන බව දන්වමි. | බැරකම් පිළිබඳ විස්තර භාණ්ඩාගාර බැරකම් පිළිබඳ ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ** මුදල් රෙගුලාසි 135 (1) | එක් එක් ගණුදෙනුව දෙතුන් දෙනෙකුගේ මාර්ගයෙන් පරීක්ෂණයට භාජනය වන පරිදි හැකි සෑම අවස්ථාවකම රාජකාරි කිහිපදෙනෙකු අතර බෙදාහැරීම කල යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ගෙවීම් සඳහා බලයදීම හා අනුමැතිය දීම එක් නිලධාරියකු ද සහතික කිරීම හා ගෙවීම එක් නිලධාරියකු ද විසින් ඉටු කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ දැනට අනුමත මාණ්ඩලික තනතුරු ලෙස ලේකම් සහ ගණකාධිකාරී තනතුර පමණක් පැවතීම හේතුවෙන් බලය දීම හා අනුමැතිය ලබාදීම එක් නිලධාරියෙකුටද, සහතික කිරීම හා ගෙවීම එක් නිලධාරියෙකුට පවරා ඇත. | මුදල් රෙගුලාසි 135 (1) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දැක්මේ සඳහන් පරිදි නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ ණය ගනුදෙනු වලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩ පිළිවෙලක් සලසා දීමට | දෙපාර්තමේන්තුවේ සේවය ව්‍යාප්ත කිරීම සඳහා 2021 දී ගම්පහ හා ගාල්ල ශාඛා මණ්ඩලද, 2022 දී කුරුණෑගල ශාඛා මණ්ඩලයද ආරම්භ කර පවත්ගෙන යනු | ලංකාව පුරා ණය ගැති භාවයෙන් පීඩාවට පත් ජනතාවට |

| | | |
|---|---|---|
| ප්‍රමාණවත් ක්‍රියාකාරකම් හදුනාගෙන නොතිබුණි. එසේම ලංකාව පුරා ණයගැති භාවයෙන් පෙළෙන ජනතාව මේ පිළිබඳව දැනුවත් කිරීමට අවධානය යොමු කර නොතිබුණි. | ලබයි. ඊට සමගාමීව දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඇතුළත් පොස්ටරයක් ගාල්ල හා ගම්පහ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බෙදාහැරීම සිදු කර ඇත. ඒ අනුව අදාළ දැනුවත් කිරීම් නිසි පරිදි සිදු කරමින් පවතී. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමට විශේෂ අවධානයක් යොමු කල යුතු වේ. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය තුල ණය සම්බන්ධ පැමිණිලිවලට අදාලව නඩු 1,525 ක් ලියාපදිංචි කිරීමට හා ඉන් 540 ක් නිම කර නඩු 985 ක් ඉදිරියට ගෙන යාමට සැලසුම් කල ද කාර්යසාධන තොරතුරු අනුව නඩු 1,364 ක් ලියාපදිංචි කර ඉන් 223 ක් පමණක් නිමකර තිබීමෙන් සත්‍ය වශයෙන් ඉල්ලුම්පත් 1,141 ක් ඊලඟ වසරේ විසඳීමට ඉදිරියට ගෙනවිත් තිබුණි. ඒ අනුව වර්ෂය තුල විසඳීමට තිබූ ඉල්ලුම්පත් වලින් සත්‍ය වශයෙන් විසඳා තිබුනේ සියයට 14.6 ක් පමණි. | 2021 වර්ෂයේ කොවිඩ් වෛරසය හේතුවෙන් රට තුළ පැවති තත්වය නිසා ණය සහනදායක මණ්ඩලයේ විමසීම් කටයුතු දෛනිකව සිදු කිරීමටත් අපේක්ෂිත අයුරින් ශාඛා මණ්ඩල ආරම්භ කිරීමටත් නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත කාර්යසාධන මට්ටමට ලඟා වීමට නොහැකි විය. | කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කල යුතු වේ. |

## 3.3 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1596/304/134 "රාජ්‍ය වියදම් සමාලෝචනය" යන මැයෙන් මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2(i) අනුව නියමිත අනුමැතීන් යටතේ ප්‍රතිපාදන වෙන් වී තිබුණද දැනට ආරම්භ කර නොමැති මිලදී ගැනීම් තාවකාලිකව අත්හිටුවිය යුතු බව දක්වා තිබිය දී එකී අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව එකතුව රු.2,063,010 ක් වූ ප්‍රසම්පාදනයන් වර්ෂය අවසානයේ සිදු කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ ශාඛා මණ්ඩල සඳහා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර කාර්යාල කටයුතු ආරම්භ කරන ලෙස අධිකරණ අමාත්‍යාංශය මඟින් දැනුම් දී තිබුණි**.** ඒ සඳහා ප්‍රමාණවත් කාර්යාල උපකරණ තිබිය යුතු වූ නිසා රු**.2,063,010**ක් වූ ප්‍රසම්පාදනයන් සිදු කර අත්‍යවශ්‍ය කාර්යාල උපකරණ පමණක් මිළදී ගන්නා ලදි**.** | අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2(i) අනුව කටයුතු කල යුතු වේ. |

### 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2020 සඳහා වූ වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ මෘදු පිටපතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, එම වාර්තාව කඩිනමින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කටයුතු කරන බව දන්වමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 3.5 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 (2)(2) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ වීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි විස්තර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි | රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සැකසීමට පියවර ගත යුතු වේ. |
| (ආ) ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට රු.මිලියන 2.5 ක් වෙන්කර තිබුණ ද ඊට අතිරේකව භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා රු. මිලියන 3.29 ක් වැයකර තිබුණි. පසුව එම සියළු ප්‍රසම්පාදනයන් ඇතුලත් කර සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මක් 2022 පෙබරවාරි 08 දින අමාත්‍යාංශ ලේකම් වෙත එවා අනුමත කරවාගෙන තිබුණි. මේ අනුව සැලසුමකින් අපේක්ෂිත අරමුණු පිළිබඳව සහ රජයේ විධිවිධාන පිළිබඳ අවබෝධයකින් කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවිය. | ප්‍රසම්පාදන සැලැස්ම මඟින් සැලසුම් කරන ලද මිලදී ගැනීම් ඇතැම් අවස්ථාවලදී අවස්ථානෝචිතව සංශෝධනය කිරීමට සිදු වූ නිසා ඊට අදාළ 2021 වර්ෂයේ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම 2022.02.08 දින පිළියෙල කර විගණනයට සහ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදි. | හැකිතාක් නිවැරදිව ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ඊට අනුගතව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.8 ප්‍රකාරව මිනිසා විසින් නිර්මාණය කරන ලද හෝ ස්වාභාවික විපත්වලදී හෝ අනපේක්ෂිත සමාජීය වගකීම් ඉටුකිරීම සඳහා සහ ඒ හා සමාන රජයේ බලධාරීන් විසින් හදිසි අවස්ථාවක් ලෙස නිර්ණය කරනු ලබන වෙනත් එවැනි සමාන තත්ත්වයක් ඇති විශේෂ අවස්ථාවලදී ප්‍රසම්පාදන අස්ථිත්වයට යම් හදිසි මිලදී ගැනීම් කළ හැකි වුවද වසර ගණනාවක සිට සැලසුම් කර තිබූ දෙපාර්තමේන්තුවේ නව ශාඛා කාර්යාල පිහිටුවීමට අවශ්‍ය රු.5,655,060 ක් වූ භාණ්ඩ හදිසි අවශ්‍යතාවයක් සේ සලකා රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාවෙන් මිලට ගෙන තිබුණි. තවද මේ සඳහා වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු නොකර පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. 2020 වර්ෂයේ දී ද මෙම ශාඛා කාර්යාල 03 වෙනුවෙන් ලැප්ටොප් පරිගණක 5, මුද්‍රණ යන්ත්‍ර 7 ක්,ෆැක්ස් යන්ත්‍ර 04 ක් රු. 1,174,028 කට මිලට ගෙන තිබුණි. | ණය සහනදායක මණ්ඩලයේ ශාඛා මණ්ඩල පිහිටුවීම අත්‍යවශ්‍ය කරුණක් වූ බැවින් ඊට අදාළ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිළදී ගැනීමට සිදුවිය. 2021 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී ස්ථාවර වත්කම් මිළදී ගැනීමේ අරමුණින් රු.මිලි 7ක් ඇස්තමේන්තු කළද, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් රු.මිලි 2ක් පමණක් වෙන් කර දී තිබුණි. අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ තුන් අවුරුදු සැලැස්ම යටතේ වෙන් කර දෙන ලද ප්‍රතිපාදන තුළින් අමතර ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් රු5,655,060.ක ස්ථාවර වත්කම් මිළදී ගැනීම් සිදු කරන ලදි. | රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) රු.5,655,060 ක භාණ්ඩ අයිතම 12 ක් මිලට ගැනීමේ දී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට අනුමත කල හැකි සීමාව ඉක්මවා තිබීම හේතුවෙන් ඉන් අයිතම 10 ක් රු.4,953,384 ක් වූ ලංසුවට සහ තවත් එක් අයිතමයක් රු.99,560 ක ලංසුවට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන් අනුමත කර මිලදී ගෙන තිබුණි. | ශාඛා මණ්ඩල වල කාර්යාල කටයුතු පවත්වාගැනීමට අත්‍යවශ්‍ය වූ කාර්යල උපකරණ පමණක් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට අනුමත කළ හැකි සීමාව යටතේ මිළදී ගන්නා ලදි. | රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඉ) රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව මගින් රු.1,063,200 කට මිලට ගැනීමට නියමිතව තිබූ Laptop පරිගණක 08 සඳහා තොග නොමැතිවීමෙන් නැවත ලංසු කැඳවීමේ දී රු.1,622,400 කට මිලට ගැනීමට සිදු වීම නිසා රු.559,200 ක පිරිවැය වැඩිවීමක් සිදු වී තිබුණි. | ශාඛා මණ්ඩල පිහිටුවීම හදිසි සහ අත්‍යවශ්‍ය කරුණක් වූ බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් ලැප්ටොප් 8ක් මිළදී ගැනිම සඳහා ඇණවුම් කර තිබිණි . නමුත් තොග නොමැති වීම හේතුවෙන් අදාල ඇණවුම අවලංගු කර ඊළඟ අවම ලංසුව ඉදිරිපත් කර තිබූ ආයතන වෙතින් මිලදී ගැනීමට කටයුතු කරන ලදි. | රජයට අලාභයක් නොවන පරිදි රජයේ මුදල් කළමනාකරණය කරගත යුතු වේ. |

**3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන් 05 දෙනෙකුගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි | එම නිලධාරීන්ගේ ඇප තැබීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව කටයුතු කල යුතුවේ. |

**3.7 ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඇතුලත් කළයුතු ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම් හා අපේක්ෂිත නිමවුම් මට්ටම ඇතුලත් කර නොතිබුණි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත දැනටමත් ඉදිරිපත් කර ඇත . | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාරය හා සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ සේවය ව්‍යාප්ත කිරීම සඳහා 2021 සිට ගම්පහ, ගාල්ල සහ කුරුණෑගල ශාඛා මණ්ඩලය ආරම්භ කර පවත්ගෙන යනු ලබන අතර දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඇතුළත් පොස්ටරයක් ගාල්ල හා ගම්පහ දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල බෙදාහැරීම සිදු කර ඇත. ඒ අනුව අදාළ දැනුවත් කිරීම් නිසි පරිදි සිදු කරමින් පවතී. | දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ)2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපාය මාර්ග කළමනාකරණ සැලැස්මට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමින් ලඟාකර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම්කර තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයට යොමුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම්කර තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයට යොමුකරීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය අනුව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර, අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ **40 (1)** ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටු විය යුතු වේ. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2022.04.19 දින ඉදිරිපත් කරන ලදි. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ |
| (ආ) | තාත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ද්විතීයික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු 20 ක් පැවතුණි. | අදාල පුරප්පාඩු හැකි ඉක්මනින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කෙරේ. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |